

# සිංහල

## 4 ශ්‍රේණිය

Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education

# 19 පාඩම

## න, ණ, ල, ළ යෙදුණු වචන තෝරමු.

### ක්‍රියාකාරකම 1

**පියවර 1**

- දී ඇති ඡේදය ශබ්ද නගා කියවමු.
- එහි ඇති න,ණ,ල,ළ යෙදුණු වචන තෝරා කොළ පාටින් කොටු කරමු.
- එම වචන පහත වගුව තුළ ලියමු.

රළ නොනඟින වේලෙහි , හිරු රැසින් බැබළෙන නිල්මිණි තලාවක් වැනි මුහුද කුඩා අපගේ සිත්හි වුව ද චමත්කාරයක් හයත් ඇති කළේ ය. එහි සුන්දරත්වය නිසා චමත්කාරය ද , එහි ගැඹුර,විශාලත්වය , මුහුදෙන් එතෙර පිටසක්වළ ය, කියන වැඩිහිටියන්ගේ බස , යන ආදිය නිසා හය ද අප තුළ හටගත්තේ ය. බාදිය කාලයෙහි ගල් පරෙහි වළවල දිවෙන විවිධ වර්ණයෙන් බැබළෙන මත්ස්‍යයන් ද , ගල්මල් ද , රන්වන් පාටින් බැබළෙන පෙඳ ද , කකුළුවන් ද , අත ගැසූ විගස හකුළාගන්නා මල් පොකුරු වැනි අඬු පඬු පොකුරු සහිත තුඩු ඇති මූදු කූඩැල්ලන් ද , ඉකිරියන් ද බලමින් ඇවිද්ද කාලය , සුරංගනා කථාවකින් ඇසූ අපූර්ව වස්තූන් සැබැවින් දුටු කාලයක් ලෙස තවමත් සිහි කළ හැකි ය.

(ගුරු මාර්ගෝපදේශයෙන් උපුටා ගන්නා ලදී.)

| න | ණ | ල | ළ |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

# සිංහල

## 1 ශ්‍රේණිය

**පියවර 2**

- න,ණ,ල, ළ යෙදුණු තවත් වචන, පෙළපොතේ 18 පාඩම 'සමනොළ කන්ද මුදුනේ අපි ඉර දැක්කා' ( පිටු අංක 97-100) යන පාඩමෙන් තෝරා ලියමු.
- ඒවා ශබ්ද නඟා කියවමු.
- පෙළපොතේ පිටු අංක 101හි සඳහන් ක්‍රියාකාරකම - 2 අභ්‍යාසය සම්පූර්ණ කරමු.



අන්තර්ගතය : සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සැකසුම : එස්.ඒ.රුවන් ලක්මාල් සමරතුංග - ර/මැටිහක්වල විද්‍යාලය - ඕපනායක